# ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව.
# පිරිපහදුව - සපුගස්කන්ද
# ඇබෑර්තු

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීම පිණිස, ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | ශ්‍රේණිය | වැටුප |
|---|---|---|
| **චාජ් හෑන්ඩ් (සිවිල්)** | **සී-1** | **රු.67625 -5x820:10x1015- 81875** |

පත්වීමේ ස්වභාවය - ස්ථිර පදනම (ඇබෑර්තු සංඛ්‍යාව - 02)

## තනතුරට අවශ්‍ය සුදුසුකම්

1. දෙවරකට නොවැඩි වනසේ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ භෞතික විද්‍යාව/ විද්‍යාව හා ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථය සහිතව විෂයයන් 06 කින් සමත්ව අවුරුදු 4-5 ක විශේෂ ආධුනිකත්වයක් සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු, අදාළ ක්ෂේත්‍රයේ පුහුණු වූ ශ්‍රේණියක අවුරුදු දෙකක (02) පළපුරුද්දක් තිබිය යුතුය. (අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී භෞතික විද්‍යාව/ විද්‍යාව හා ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථය නොමැති නම් අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් එම විෂයයන්ට සාමාන්‍ය සාමාර්ථයක් තිබිය යුතුය.)

   නැතහොත්,

2. දෙවරකට නොවැඩි වනසේ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව/ ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථය සහිතව විෂයයන් 06 කින් සමත්ව අවුරුදු 4-5 ක ආධුනිකත්වයක් සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවුරුදු හයක (06) පළපුරුද්දක් තිබිය යුතුය.

3. වෘත්තීය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

**වයස් සීමාව** - අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි .

## ප්‍රධාන රාජකාරි

1. පිරිපහදු යන්ත්‍රාගාර ප්‍රදේශයේ ඇති බොයිලේරු පෝරණු, චිමිනි යන ආදියෙහි "රිප්‍රැක්ටරි" ගිනිගල් (Fire bricks) හා අනෙකුත් තාප පරිවාරක ද්‍රව්‍ය (Insulation) යෙදීම.

2. පිරිපහදුවේ ඇති උපකරණ, පයිප්ප පද්ධති හා ටැංකි යන ආදියෙහි වැලි මගින් පෑහීම (Sandblasting) හා තීන්ත ආලේප කිරීම පිළිබඳ කටයුතු

3. කොන්ක්‍රීට් වැඩ, බිත්ති බැඳීම, කපරාදු කිරීම, සිමෙන්ති දැමීම, ටයිල් කිරීම, වඩු වැඩ, ජලනල කාර්මික වැඩ යන සිවිල් ඉංජිනේරුමය වැඩ මනා අවබෝධයකින් සිදු කිරීම.

4. පිරිපහදුවේ හා ඉන් පිටත පිහිටා ඇති භූගත නල මාර්ග පද්ධතිවල නඩත්තු කටයුතු සිදු කිරීම

5. ඔරුගොඩවත්ත ටැංකි සංකීර්ණයේ, ජල පවිත්‍රාගාරයේ හා පිරිපහදු නිවාස යෝජනා ක්‍රමයේ සිවිල් නඩත්තු කටයුතු ඉටු කිරීම

6. සිවිල් ඉංජිනේරු උපකරණ ක්‍රියාකරවීම

7. පිරිස්බල සැකසුම අනුව, පවතින ශ්‍රම බලකාය හා කොන්ත්‍රාත් ශ්‍රමය නිසි අයුරින් හසුරවමින් ඉහත සඳහන් සිවිල් ඉංජිනේරුමය කාර්යයන් ඵලදායීව හා කාර්යක්ෂමව නිසි තත්ත්වයට හා ප්‍රවේශම් ක්‍රියාපටිපාටියට අනුකූලව ඉටු කිරීම

**අමතර ප්‍රතිලාභ**

සංස්ථාවේ වෛද්‍යාධාර ක්‍රමය යටතේ නොමිලයේ වෛද්‍යාධාර පහසුකම්, නිවාස ණය පහසුකම් , වාහන ණය පහසුකම් යනාදිය හිමිවනු ඇත.

සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකත්වය සඳහා සේවකයා තම වැටුපෙන් 10% ක ප්‍රමාණයකින් දායක විය යුතු අතර, ඒ සඳහා සංස්ථාවෙන් 15% ක ප්‍රමාණයක් ගෙවනු ලැබේ. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙනුවෙන් වැටුපෙන් 3% ක ප්‍රමාණයක් සංස්ථාවෙන් ගෙවනු ලැබේ.

**අයදුම්කිරීමේ පිළිවෙළ.**

සංස්ථා වෙබ් අඩවියේ (www.ceypetco.gov.lk ) පළ කර ඇති පොදු අයදුම්පත්‍රයේ ආකෘතිය භාවිතා කර ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත්‍රය සමඟ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව විස්තරාත්මක අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු වේ.

රජයේ දෙපාර්තමේන්තුවල හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතු අතර, ඔවුන් විසින් අදාළ අයදුම්කරු මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත්, තම ආයතනයෙන් මුදා හැරීමට ඇති හැකියාව සඳහන් කළ යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කර, 2018.04.02 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

සභාපති
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව.
අංක.609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.

2018.03.19 දින,
එස්/එස්